දැන්වීම්

## කර්මාන්ත අමාත්‍යාංශය

## පරන්තන් කෙමිකල්ස් කම්පැණි ලිමිටඩ්

# ලංසු සඳහා ආරාධනයයි

## කාර්යාල ඉඩකඩ (කුලී පදනම මත)

කොළඹ 13, ශ්‍රී රමනාදන් මාවතේ අංක 100/25 හි පිහිටි පරන්තන් කෙමිකල්ස් කම්පණි ලිමිටඩ් හි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් වසර තුනක කාලයක් සඳහා කුලී පදනම මත කාර්යාල ඉඩකඩ ලබාගැනීම සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. මූලික අවශ්‍යතා පහත පරිදි වේ.

- රත්මලාන, ගල්කිස්ස, දෙහිවල, වැල්ලවත්ත, බම්බලපිටිය, කොල්ලුපිටිය හෝ කොළඹට තුදුරින් පිහිටි ගොඩනැගිල්ලක ඉදිරිපත් කරනු ලබන කාර්යාල ඉඩකඩ පිහිටා තිබිය යුතුය.
- වර්ග අඩි 3000 සිට 4000 දක්වා මුළු බිම් ප්‍රමාණයක් සහිත බහු මහල් හෝ තනි මහල් ගොඩනැගිල්ලක් විය යුතුය. (ගබඩාව සහ කාර්යාලය)
- ජලය, විදුලිය, දුරකථනය, වායු සමීකරණය සහ සනීපාරක්ෂක පහසුකම් වැනි ප්‍රමාණවත් පහසුකම් ගොඩනැගිල්ලේ තිබිය යුතුය. (අවම වශයෙන් පුද්ගලයන් 06 ක් සහ නාන කාමර)
- ඉදිරිපත් කරනු ලබන පරිශ්‍රයේ අමතර වාහන ගාල් කිරීමේ ඉඩකඩ, වාහන 08 ක් සඳහා (මෝටර් රථ 05 සහ ලොරි රථ 03 ක්) වාහන නවතා තැබීමේ පහසුකම් තිබිය යුතුය.
- සියලුම අවශ්‍ය අවසර හා අනුමැති සහිතව ගොඩනැගිල්ල (පරිශ්‍රය) භාරගැනීම සඳහා සහ භාවිත කිරීම සඳහා සූදානම්ව තිබිය යුතුය.
- පරිශ්‍රය තුළ වර්ග අඩි 1500 සිට වර්ග අඩි 2000 දක්වා බිම් ප්‍රමාණයක් ගබඩාව සඳහා වෙනම තිබිය යුතුය.
- ගොඩනැගිල්ල කුටි (කියුබිකල්) 03ක් (වර්ග අඩි 120 සිට 150ක් දක්වා) / කුටි 03 ක් (වර්ග අඩි 100 ක් පමණ) සහ කුටි 06 ක් (වර්ග අඩි 80 ක් පමණ) ලෙස වෙන් කර තිබිය යුතු අතර, සේවකයන් 50 දෙනෙකුට පමණ ප්‍රමාණවත් ඉඩකඩ තිබිය යුතුය.

කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ 06 දෙනෙකු සඳහා නවාතැන් පහසුකම් අවශ්‍ය වේ.

**ලංසුවලට පහත සඳහන් දෑ ඇතුළත් විය යුතුය.**

1. ගොඩනැගිලි හිමිකරු හෝ හිමිකරුගේ බලයලත් නියෝජිතයා විසින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුය. නියෝජිතයා විසින් අභිලාෂ ප්‍රකාශ කිරීම් සමග බලය පවරන ලද ලිපිය ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැති වුවහොත්, ලංසුව අවලංගු වූ ලංසුවක් ලෙස සලකනු ලැබේ.
2. තමා විසින් සකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර සමග ලංසුව පිටපත් දෙකකින් යුතුව සකස් කර වෙන් වෙන් වශයෙන් කවරවල බහා "මුල් පිටපත" හා "අනුපිටපත" ලෙස සඳහන් කර ගොඩනැගිල්ලේ ඡායාරූප හා හිමිකම් ඔප්පුවේ පිටපතක් සමග මුද්‍රා තබන ලද කවරයක බහා ඉදිරිපත් කළ යුතුය. ලංසු බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**කුලී පදනම මත කාර්යාල, ඉඩකඩ සැපයීම**" යනුවෙන් සඳහන් කළ යුතුය.
3. සම්පූර්ණ කරන ලද ලංසු, 2021 මාර්තු 09 වැනි දින පෙ.ව. 10.30 ට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ පහත සඳහන් ලිපිනයේ පරන්තන් කෙමිකල්ස් කම්පැණි ලිමිටඩ් කාර්යාලය වෙත ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලබන අතර, ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිත පැමිණ සිටිය හැකිය.

   වැඩිදුර විස්තර සාමාන්‍යාධිකාරී - 0770599920 හෝ සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන) - 0761-326922.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**අංක 100/25, ශ්‍රී රාමනාදන් මාවත, කොළඹ 13.**
**www.pccl.gov.lk**